**ශීර්ෂය 145 - බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශය බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුමෙන් හා සැසඳුම් ප්‍රකාශනයෙන් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

**1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම**

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට ආදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**1.3 විගණන විෂය පථය**

---

ශීර්ෂය 145 - බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති,රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 ඔක්තෝබර් 29 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත්

සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

-------------------------

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශයේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.7 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 127 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශ ගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටුකර තිබූණු බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 127 විධිවිධානය** | | | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරී එම විධිවිධානයට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|---|
| **මුදල් රෙගුලාසි 127 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය** | | | | |
| මුදල් රෙගුලාසි 127 (1)(අ) | නිවැරදිව සහ මූල්‍ය විධිමත් බවෙන් යුක්තව කටයුතු කරන බව තහවුරුවන පරිදි සියළු මූල්‍ය කාර්යයන් සැලැසුම් කළ යුතු වීම. (දෙපාර්තමේන්තු කටයුතු සිදු කළ යුත්තේ හුදෙක් මූල්‍ය හා දෙපාර්තමේන්තු නියෝගවලට අනුකූලව පමණක් නොව, රාජ්‍ය කටයුතු ඉටු කිරීමේදී බලාපොරොත්තුවන අවංකභාවය පිළිබඳ උසස් තත්ත්වයන්ට අනුකූල බව) | 1. | ප්‍රසම්පාදන කටයුතු සැලැසුම් නොකිරීම/ ප්‍රමාණවත් පරිදි සැලැසුම් නොකිරීම | 2.1 |
| 127(1)(ආ) | වියදම් සහ රාජ්‍ය ආදායම් එකතු කිරීම පිළිබඳව ප්‍රමාණවත් තරම් පාලනයකට විධිවිධාන සැලැසෙන ක්‍රමයක් සම්පාදනය කළ යුතුවීම. | 1. | කළමනාකරණ අඩුපාඩු | 2.3 |
| | | 2. | අනුකූල නොවීම් | 2.6 |
| | | 3. | මානව සම්පත් කළමනාකරණයේ අඩුපාඩු. | 2.7 |

| | | | |
|---|---|---|---|
| 127(5) | දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුවල ප්‍රතිපාදිත මුදල හා වියදම අතර ඇති සැලැකිය යුතු වෙනස්වීම් අමාත්‍යාංශයේ දැඩි ලෙස පරීක්ෂණයට භාජනය කෙරෙන බව | 1. පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් මගින් ලබාගත් ප්‍රතිපාදන උපයෝජනය කිරීමේ අඩුපාඩු | 2.4 |
| 127(6) | ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම පිට පවත්නා වූ ආදායම් නොහොත් රජයට ලැබිය යුතු වෙනත් ගාස්තු එකතු කිරීමේ කාර්යය ගැන දැඩි සෙවිල්ලෙන් සිටිමින් එම කාර්යය අමාත්‍යාංශයේ පරීක්ෂණයකට භාජනය කිරීම | 1. රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ සඳහන් අඩුපාඩු | 2.5.2 |
| 127(7) | නිලධාරීන්ගේ/සේවකයින්ගේ ප්‍රමාදය, නොසැලැකිල්ල, වරද හෝ වංචාව නිසා රජයට පාඩු සිදු වී ඇති අවස්ථාවලදී මුදල් රෙගුලාසි 103 සිට 108 දක්වා රෙගුලාසිවල නියම කර ඇති කාර්ය පරිපාටිය ගණන්දීමේ නිලධාරීන් විසින් අනුගමනය කරනු ලබන බවටද, මුදල් රෙගුලාසි 156(1) අනුව එම පාඩු සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්/සේවකයන් මත අධිභාර පැනවීමද, වගබලා ගැනීම පිණිස විධිවිධාන යොදන ලද්දේනම් තමා වෙත පැවැරී ඇති වගකීම්වලින් ගණන්දීමේ නිලධාරියා නිදහස් වූවාක් ලෙස සලකනු ලැබේ. රාජ්‍ය ගිණුම් කාරක සභාව හමුවේ පෙනී සිට, තමා වගකීම් දරන දෙපාර්තමේන්තුවල ගිණුම් පැහැදිලි කිරීමෙන් හා සාධාරණීය කිරීමෙන් ගණන්දීමේ නිලධාරියා සමඟ සහාය වීමද ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ රාජකාරී භාරයක් වීම. | 1. පාඩු හා හානි | 2.2 |

## 2 ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 2.1 ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සැපයීම් හා සේවා ලබා ගැනීම

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වාහන 2 ක් මිලදී ගැනීමට සිදු කරන ලද රු. 62, 998, 989 ක් වූ කොන්ත්‍රාත්තුවේ කාර්යසාධන ඇපකරයක් ලබාගෙන නොතිබූ අතර ගිවිසුමකටද එළඹ නොතිබුණි.

(ආ) පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශයේ කාර්යාල වෙන් කිරීම් හා ආහාර ගැනීමේ ස්ථානයක් සකස් කිරීමට ප්‍රසම්පාදනයක් සිදු නොකර රු. 757, 944 කට කොන්ත්‍රාත්තුවක් ලබාදී තිබුණි. ගිවිසුමකට එළඹ නොතිබූ අතර රඳවාගැනීම් මුදල් අය නොකර මුළු මුදලම ගෙවා තිබුණි.

### 2.2 පාඩු හා හානි

2012 හා 2015 වර්ෂවලදී සිදුවූ වාහන අනතුරු 03 ක් සම්බන්ධයෙන් වූ රු.131,328 ක් වූ හානිය හඳුනාගෙන තිබුණද, වගකිවයුතු අයගෙන් අයකර ගැනීමට 2018 ඔක්තෝබර් වන විටත් කටයුතු කර නොතිබුණි

### 2.3 කළමනාකරණ දුර්වලතා

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කන්දකාඩු ප්‍රදේශයේ ඉදිකරන ලද අර්ධ ස්ථිර ගොඩනැගිලි 20 ක් ගිවිසුම ප්‍රකාරව ඉදිකිරීම දින 90 ක් තුල නිමකර නොතිබුණු අතර ඒ සඳහා කොන්ත්‍රාත් කරුගෙන් අයකල යුතු සියයට 10 ක ප්‍රමාද ගාස්තුව වෙනුවට සියයට 05 ක් අයකර තිබුණි. මේ අනුව රු.1,335,288 ක් අඩුවෙන් අයකර තිබුණි.

(ආ) 2014 ඉදිකිරීම් ආරම්භ කරණ ලද කන්දකාඩු රෝහල ඉදිකිරීම 2018 ඔක්තෝබර් වනවිටත් නිමකර නොතිබුණි. ඉදිකිරීමට අවශ්‍ය ශ්‍රමය යුධ හමුදාවෙන් ලබාගැනීමට සැලසුම්කර තිබූ අතර එය ඉටුව නොතිබීම හේතුවෙන් බාහිර ශ්‍රමය ලබාගෙන රු. 2,119,060 ක් ගෙවා තිබුණද, ඊට අවශ්‍ය අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ඇ) වව්නියාව පූන්තෝට්ටම්හි පුනුරුත්ථාපන මධ්‍යස්ථානය ඉදිකිරීමට රු. 3,100,000 ක් ප්‍රතිපාදන වෙන් කරගෙන තිබුණද, ඊට අවශ්‍ය ඉඩම 2018 ඔක්තෝබර් වනවිටත් හඳුනාගෙන නොතිබුණි.

**2.4 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබූණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම**

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය හා ඉකුත් වර්ෂය තුළ අමාත්‍යාංශයට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය<br>රු.මිලියන | උපයෝජනය<br>රු.මිලියන | ඉතිරිය<br>රු.මිලියන | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| 2016 | පුනරාවර්තන | 955 | 933 | 22 | 2 |
| | මූලධන | 16,970 | 13,690 | 3,280 | 19 |
| | **එකතුව** | **17,926** | **14,623** | **3,303** | **18** |
| 2017 | පුනරාවර්තන | 1,015 | 1,003 | 12 | 1 |
| | මූලධන | 11,712 | 10,278 | 1,434 | 12 |
| | **එකතුව** | **12,727** | **11,281** | **1,446** | **11** |

**(ආ) විසර්ජන ගිණුම**

**i සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම.**

වැය විෂයයක් සඳහා තිබුණු රු.100,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

**ii අධි ප්‍රතිපාදන සලසා තිබීම.**

වැය විෂයයන් 22 ක් සඳහා එකතුව රු.මිලියන 694 ක අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා එම වැය විෂයයන්ට අදාළ ප්‍රතිපාදනවලින් එකතුව රු.මිලියන 459 ක් පමණක් උපයෝජනය කිරීම නිසා ඉතිරිය සලසා තිබුණ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 22 ක සිට සියයට 100 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

**2.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**2.5.1 පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාල විෂය අංක 14501 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 9 | 8.9 | 4 | 4.8 | 37 | 15.6 |

### 2.5.2 හිඟහිටි ණය ශේෂ අයකර නොගැනීම

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.235,206 ක් විය. එම හිඟහිටි ණය ශේෂ වර්ෂ 05 සිට වර්ෂ 07 ක් දක්වා කාල පරාසයක් ගත වී තිබුණු මෙම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්වයක පැවතුණි.

## 2.6 අනුකූල නොවීම

### 2.6.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| (i) මුදල් රෙගුලාසි 104 | 2016 හා 2017 වර්ෂවල සිදු වූ වාහන අනතුරු 11 ක් සම්බන්ධයෙන් මූලික පරීක්ෂණ පවත්වා හානිය රු. 2,919,447 ක් ලෙස හඳුනාගෙන තිබුණද, ඒ සම්බන්ධයෙන් අවසන් පරීක්ෂණ සිදුකර නොතිබුණි. |
| (ආ) 2010 මැයි 14 දිනැති අංක CA/1/17/1 දරන ජනාධිපති ලේකම් කාර්යාලයේ චක්‍රලේඛයේ | නිළ දුරකථන සම්බන්ධතා සඳහා ජංගම දුරකථන 01 ක් පමණක් ලබාගත යුතු වුවත් 2015,2016 හා 2017 වර්ෂවලදි ජංගම දුරකථන 03 ක් අමාත්‍යවරයාගේ පෞද්ගලික ප්‍රයෝජනය සඳහා |

5.1 ඡේදය මිලදී ගෙන තිබුණි.

## 2.7 මානව සම්පත් කළමනාකරණය

## 2.7.1 අනුමත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම

කාර්යාලයේ 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රුපියල් මිලියන 97.39 ක් වැය කර තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 21 | 12 | 09 |
| (ii) | තෘතියික මට්ටම | 07 | 03 | 04 |
| (iii) | ද්විතියික මට්ටම | 106 | 86 | 20 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 37 | 29 | 08 |
| | **එකතුව** | **171** | **130** | **41** |

ඉහත පුරප්පාඩු පිරවීමට අවශ්‍ය කටයුතු සිදුකරණ ලෙස අවස්ථා 4 කදී රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් ඉල්ලීම් කලද, 2018 ඔක්තෝබර් දක්වා පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණි.